රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය
அரசாங்க நிருவாகச் சுற்று நிருபம்
Public Administration Circular

අංක
இல.
No. } 51

# රජයේ සේවයේ තරඟ විභාග සම්බන්ධ පන්ති සඳහා කථිකාචාර්යවරුන්ට ඇරයුම් කිරීම

# அரசாங்க சேவையிலுள்ள போட்டிப் பரீட்சைகள் சம்பந்தமான வகுப்புகளுக்கு விரிவுரையாளர்களை அழைத்தல்

# Invitation of Lecturers for classes connected with Competitive Examinations in the Public Service

ආයතන චක්‍රලේඛ මාලා අංක
தாபனத் தொடர் இல.
Establishments Series No. } 39

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයි

මිළ/விலை/Price : -/10 තැපැල් ගාස්තුව/தபாற் செலவு/Postage : -/15

අංකය : 2/9/704 (එච්).
1972 මැයි මස 4 දින,
කොළඹ 7, නිදහස් චතුරශ්‍රයේ පිහිටි
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ
කටයුතු අමාත්‍යාංශයේ දී ය.

සියළුම ස්ථිර ලේකම්වරුන් හා
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙතය.

**රජයේ සේවයේ තරඟ විභාග සම්බන්ධ පන්ති සඳහා කථිකාචාර්යවරුන්ට ඇරයුම් කිරීම**

ලංකා පරිපාලන සේවා විවෘත තරඟ විභාගයට හා රජයේ සේවයේ උසස් කිරීම් සඳහා වූ වෙනත් සීමිත තරඟ විභාගවලට පෙනී සිටීමට අදහස් කරන නිලධාරීන් විසින් පංති සංවිධානය කරනු ලැබ ඇති බව රජයේ අවධානයට යොමු කෙරී තිබේ.

2. රජයේ භූමි තුළ එම පංති පවත්වනු ලබන අවස්ථාවන්හි, රජයේ සේවයට පිටතින් කථිකාචාර්යවරුන්ට ඇරයුම් කිරීම සඳහා මගෙන් කල්තියා අවසර ලබා ගත යුතු බව තීරණය වී ඇත. එසේ අවසර ඉල්ලන සියලු ඉල්ලුම්පත්වල කථිකාචාර්යවරයාගේ නම හා ලිපිනයත්, ඔහුගේ වෘත්තිය හා අධ්‍යාපන සුදුසුකමුත්, පන්තිය පවත්වනු ලබන්නේ කවර විභාගයක් සඳහාද යන්නත්, එය පවත්වනු ලබන ස්ථානයත්, පංතිය පවත්වනු ලබන්නේ කාර්යාල වේලාව ඇතුළතද යන්නත් සඳහන් විය යුතුය. එම ඉල්ලුම්පත්, පංතිය පැවැත්වීමට අදහස් කරනු ලබන භූමිය අයත් දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින්, සහ අදළ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් මගින් ඉදිරිපත් කළ යුතුය.

3. මේ චක්‍රලේඛයේ අඩංගු කරුණු සියලු නිලධාරීන්ට දැනගන්නට සලස්වනු මැනවි.

පී. සිරිවර්ධන.

රාජ්‍ය පරිපාලන, පළාත්පාලන හා ස්වදේශ
කටයුතු භාර අමාත්‍යාංශයේ වැඩ බලන ස්ථිර ලේකම්.

ඉක් 14048—9,509 (72/6)